**නින්තවූර් ප්‍රාදේශීය සභාව**
**අම්පාර දිස්ත්‍රික්කය**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන2019 අප්‍රේල් 08 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව හා කළමණාකරණ විගණන වාර්තාව 2019 මැයි 31 දින සභාපතිවරයාට වෙත යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට නින්තවූර් ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

#### (අ) ගිණුම්කරණ අඩුපාඩුව

| | ගිණුම්කරණ අඩුපාඩු | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | 2018 දෙසැම්බර් 31 දින Motor Grader යන්ත්‍රයෙන් ලැබිය යුතු කුලි රු. 96,620 ක් මූල්‍ය ප්‍රකාශනවලට ගෙනවිත් නොතිබුණි. | ලැබිය යුතු කුලි ආදායම් ගිණුම්ගත කල යුතු වේ. | Motor Grader හිඟ සම්බන්ධයෙන් තොරතුරු කිසිවත් ඉදිරිපත් නොවීමෙන් අවසාන ගිණම්වලට ගෙනවිත් නොතිබුණි. |
| (ii) | සභාවේ පැරණි කාර්යාල ගොඩනැගිල්ල කුලියට දීමෙන් ලැබිය යුතු මාස 36 කට අදාල රු. 540,000 ක් ගිණුම්වලට ගෙනවිත් නොතිබුණි. | ලැබියයුතු කුලී ආදායම් ගිණුම්ගත කල යුතු වේ. | සභා ගොඩනැගිල්ලේ කුලී මුදල ගෙවන ලෙස NTR/PS/FA/GEN/2017 අංක හා 2018/04/18 දින ලිපිය මගින් අදාල අමාත්‍යාංශයට දැන්වූවද, පිළිතුරු නොලද හෙයින් ගිණුම්වලට ගෙනවිත් නොතිබුණි. |
| (iii) | 2018 වර්ෂයේ අමීර් මේර්සා මහජන පුස්තකාලය සඳහා පරිත්‍යාග වශයෙන් ලැබුනු පොත් 44 ක වටිනාකම තක්සේරු කර අවසන් ගිණුම්වල ගෙනවිත් නොතිබුණි. | වටිනා කම තක්සේරු කර ගිණුව්වල සටහන් කිරීම කළ යුතු වේ. | අමීර් මේර්සා මහජන පුස්තකාලයේ පුස්තකාලාධිපති උක්ත පොත් 44 සම්බන්ධ ලියවිලි හෝ වටිනාකම ලබා නොදුන් නිසා ගිණුම්වල ඇතුලත් කර නැත. කෙසේවූවද, වටිනාකම ගණනය කර ගිණුම්ගත කිරීමට කටයුතු කරමි. |

**(ආ) ලැබියයුතු හා ගෙවියයුතු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| වීථි පහන් විදුලි පාරිභෝජන සම්බන්ධයෙන් ලංකා විදුලි බල මණ්ඩලයට ගෙවිය යුතු විදුලි පාරිභෝජන ගාස්තු රු. 2,951,150 සහ විදුලි බල මණ්ඩලයෙන් අයවිය යුතු රු. 2,477,322 ක් ගෙවීමටත් සහ අයකිරීමටත් කටයුතු නොකර වර්ෂ 22 කට වඩා වැඩි කාලයක් දිගටම මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | ගෙවීමට හෝ අයකිරීමට හෝ නිසි පරිදි කපා හැරීමට කටයුතු කළ යුතු වේ. | මෙම ශිෂ මුදල ගම් සභා කාලයට අයත් ඒවායේ, කපා හැරීමට කටයුතු කරනු ලැබේ. |

**(ඇ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැති වීම.**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| රු. 42,842,560 ක් වටිනා ගිණුම් විෂයයන් 5ක් ඉඩම් ඔප්පු , ස්ථාවර වත්කම් ලේඛන සත්‍යාක්ෂණ නොමැති වීමෙන් විගණනයේදී සතුටු දායක ලෙස සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශනයේ දක්වා තිබූ ගිණුම් ශේෂ සනාථ කිරීමට අවශ්‍ය සාක්ෂි ඉදිරිපත් කළ යුතුය | ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් සම්පූර්ණ විස්තර අවසන් ගිණුම්වල දක්වා නොතිබුණි. ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් එහි වර්ගය වටිනාකම වෙන්වෙන් වශයෙන් පෙන්වීමට කටයුතු කරනු ලැබේ. |

**1.4 අනුකූල නොවීම**

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.**

| නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති වගන්තිය 193 | සමාලෝචිත වර්ෂයේ අයවැයගත හා පරිපූරක සම්මත වැය සමග තත්‍ය වියදම් සසඳා, අතිරික්ත හා ඌනතා පිළිබඳ හේතු දැක්වෙන ප්‍රකාශයක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | නිසි කාලවලදී ප්‍රකාශන පිළියෙල කර විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු වේ. | අයවැය සමග ආදායම සමාලෝචනය කිරීමේ වාර්තාව ඉදිරියේදි ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571 | වර්ෂ දෙකක් ඉක්මවූ රු. 1,512,758 ක් වටිනා කල් ඉකුත්වූ තැන්පත් 31 ක් සම්බන්ධයෙන් අදාල පුද්ගලයින්ට ආපසු ගෙවීමට හෝ ආදායම් ගිණුමට මාරු කිරීමට කටයුතු කර නොතිබුණි. | අදාල පුද්ගලයන්ට ආපසු ගෙවීමට හෝ අදායම් ගිණුම්වලට මාරු කිරීමට කටයුතු කළ යුතු වේ. | කල් ඉකුත්වූ තැන්පත් සම්බන්ධයෙන් අයිතිකරුවන්ට දන්වා ඔවුන් ලබා නොගතහොත් ආදායමට ගැනීමට කටයුතු කරනු ඇත. |

**2.** **මූල්‍ය සමාලෝචනය**

**----------------------**

**2.1** **මූල්‍ය ප්‍රතිඵල**

**----------------**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු.4,043,938ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන ආදායම් ඉක්ම වූ වියදම් රු.396,368ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්,බිල් කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම්හා බදු | 8,848,000 | 4,464,300 | 2,984,750 | 4,817,677 | 6,250,000 | 4,424,540 | 3,377,020 | 3,338,127 |
| කුලී | 8,415,000 | 5,134,940 | 5,159,570 | 3,250,566 | 5,125,000 | 3,069,750 | 3,039,020 | 3,275,196 |
| බලපත්‍රගාස්තු | 1,025,000 | 827,150 | 827,150 | - | 1,525,000 | 648,700 | 648,700 | - |
| වෙනත් ආදායම් | 13,025,000 | 12,784,869 | 12,618,037 | 3,344,790 | 8,500,000 | 7,604,681 | 7,277,198 | 3,177,958 |

**2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දින දක්වා සභාව විසින් අයකළයුතු ආදායම් රු. 33,002,540 කින් සමාලෝචිත වර්ෂයේදී රු. 21,589,507 ක් අයකර ගෙන තිබුණි. මේ අනුව ආදායම් රැස්කිරීමේ ප්‍රගතිය සියයට 65% ක් විය. | ආදායම් රැස්කිරීම් වර්ධනය කර ගැනීමට වේ. | පිළිතුරු ලැබී නැත. |

**2.2.3 වරිපනම් හා බදු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 වර්ෂය දක්වා හිඟව තිබූ වරිපනම් බදු රු. 4,817,677 ක් අයකර ගෙන නොතිබූ අතර මේ සම්බන්ධයෙන් කාල විශ්ලේෂණයක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | හිඟව තිබූ වරිපනම් බදු රු. 4,817,677 ක් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | වරිපනම් බදු හිඟය අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ. |

**2.2.4 කුලී**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 1980 සිට 2012 වර්ෂය අවසානය දක්වා හිඟව තිබූ මස්කඩ බදුකුලී රු. 3,173,466 ක් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා අයකර ගෙන නොතිබුණි. | හිඟව තිබූ මස්කඩ බදුකුලී අයකර ගැනීමට හෝ නිසි පරිදි කපා හැරීමට කටයුතු කළ යුතු වේ. | දීර්ඝ කාලයක සිට හිඟව තිබෙන මස්කඩ බදුකරුවන්ට ලිපි යවා තිබුණද, අදාල අය මියගොස් හෝ වැරදි ලිපිනයන් සඳහන් කර මස්කඩ බදු ලබා ගෙන තිබුණි. එම නිසා මෙම හිඟ මුදල කපා හැරීමට සභාව කටයුතු කරනු ඇත. |

**2.2.5 මුද්දර ගාස්තු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2017 සහ 2018 වර්ෂවල මුද්දර ගාස්තු පිළිවෙලින් රු. 10,786,740 ක් සහ රු. 9,528,100 ක් රෙජිස්ට්‍රාර් ජනරාල් වරයාගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. තවද, ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ | නිසි තොරතුරු ලබාගෙන අදාල මුද්දර බදු අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | ඉඩම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවෙන් ලබා දෙන තොරතුරුවල පිටපත් සහ ප්‍රමාණය මුල්කර ගෙන අපගේ සභාවට අයවිය යුතු ප්‍රමාණය අයදුම්කිරීමට හැකිය. |

තිබෙන නිශ්චල දේපල මාරුකිරීමේදි, නැගෙනහිර පළාත් ආදායම් බදු දෙපාර්තමේන්තුවෙන් 2017 සහ 2018 වර්ෂවලදි ඍජුව හෝ ජංගම සේවය මගින් අයකරගත් අතිරේක මුද්දර බදු ගණනය කර අයකර නොතිබුණි.

**2.2.6 නිශ්චල දේපල විකිණීම මත බදු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 154 වගන්තිය අනුව 2017 වර්ෂයේ ජනවාරි මස සිට දෙසැම්බර් මස දක්වාවූ කාල පරිච්ඡේදයේ නිශ්චල දේපල 1,150 ක් විකිණීමෙන් ලැබුණු ආදායම රු. 378,345,000 ක්මත සියයට 01 ක් බදු වශයෙන් රු. 3,783,450 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත අනුව ආදායම් ලබාගත හැකි මාර්ග හඳුනාගෙන කටයුතු කළ යුතු වේ. | අප බල ප්‍රදේශයේ වෙන්දේසි මගින් විකුණන නිශ්චල දේපල වල වටිනාකමින් සියයට 01 ක් අයකරනු ලැබේ. නිශ්චල දේපල විකුණුම්, මිලදී ගැනීම් සම්බන්ධයෙන් මුද්දර බදු වශයෙන් අයවියයුතු ප්‍රමාණය අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යසාධන**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධන යන සභාව විසින් ඉටුකළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කරීම් පිළිබඳව අනාවරණයවූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත් 126 වගන්තිය අනුව, ප්‍රාදේශීය සභාවේ ආදායම් සහ විධිමත් කිරීම සඳහා ප්‍රධාන කාරණා 20 ක් සඳහාඅතුරු ව්‍යවස්ථා සකස්කර ක්‍රියාත්මක කළයුතු වුවද, 2018 දෙසැම්බර් 31 දින දක්වා කරුණු 14 ක් සඳහා අතුරු ව්‍යවස්ථා සකස්කර නොතිබුණි. | ප්‍රධාන කාරණා සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථා සකස්කර අනුමැතිය ලබාගෙන ක්‍රියා කළ යුතු වේ. | අනෙක් කාරණා සඳහා අතුරු ව්‍යවස්ථා පනවා ඇත. |

(ආ) ක්‍රියාකාරී සැලැස්ම

---------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පනවා තිබූ අතුරු ව්‍යවස්ථා 06 ක් අනුව සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා අනුව ක්‍රියාත්මක කළයුතු ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් ක්‍රියාකාරී සැලස්මක් පිළියෙල කළ යුතු වේ. | පනවන ලද අතුරු ව්‍යවස්ථා අනුව ව්‍යපෘති සකස් කරනු ලැබේ. |

(ඇ) ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය

----------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය යටතේ කසල වෙන්කර භාර ගැනීම සඳහා පවුල් 5,000 ක් සඳහා බෑග් 10,000 ක් රු. 385,000 ක මුදලකට මිලදී ගෙන මහජනයාට නිකුත් කිරීමේදී බෑග් 3,351 නිකුත් නොකර තිබුණු අතර එකතු කරන ලද කසල වෙන් නොකර සහ ප්‍රතිචක්‍රියකරණය නොකර බැහැර කර තිබුණි. | එකතු කරන ඝණ අපද්‍රව්‍ය නිසි පරිදි ප්‍රතිචක්‍රිය කරනය කිරීමට කටයුතු කළ යුතු වේ. | ඝණ අපද්‍රව්‍ය පම්බන්ධයෙන් කසල වර්ගීකරණය කිරීම මුලදි කරන ලද අතර වල් අලීන්ගෙන් වන කරදර නිසා මෙය ක්‍රියාත්මක කිරීමට නොහැකිවී ඇත. |

(ඇ) තිරිසර සංවර්ධන ඉලක්ක

-------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2017 අංක 19 දරන ශ්‍රී ලංකා තිරසර සංවර්ධන පනත අනුව 2030 වර්ෂයේ එක්සත් ජාතින්ගේ න්‍යාය පත්‍රයට අනුකූල වන පරිදි සෑම පොදු ආයතනයම ක්‍රියා කළයුතුයි. කෙසේ වුවත් මේ සම්බන්ධ ඉලක්ක හඳුනාගෙන ලඟා කරගැනීමට සභාව කටයුතු කර නොතිබුණි. | ඉලක්ක හඳුනාගෙන ඒවා මැනීමට දර්ශන හඳුනාගෙන ලඟා කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | තිරසර සංවර්ධන සංවර්ධන ඉලක්ක සමඟ සභාවේ කටයුතු විධිමත් කිරීමට කටයුතු කරනු ලැබේ. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

-------------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | කාර්යාල ගොඩනැගිල්ල, මහජන පුස්තකාල, මහජන පොල, පොදු ක්‍රිඩා භූමි, උද්‍යාන සහ සාතකාගාරය පිහිටුවා ඇති ඉඩම්වල අයිතිය | අයිතිය සභාවේ නමට මාරු කිරීම සඳහා කටයුතු කළ යුතු වේ. | අවශ්‍ය කටයුතු කරනු ලැබේ. |

| | | | |
|---|---|---|---|
| | සභාවේ නමට මාරුකිරීම සඳහා කටයුතු කර නොතිබුණි. | | |
| (ආ) | සභාව විසින් ප්‍රයෝජනයට ගනු ලබන මෝටර් වාහන සහ යන්ත්‍ර 05 ක් සභාවේ නමට අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | අයිතිය සභාවේ නමට මාරු කිරීම සඳහා කටයුතු කළ යුතු වේ. | අවශ්‍ය කටයුතු කරනු ලැබේ. |
| (ඇ) | කළමණාකරන කමිටු වාර්තා පොත විගණයට ඉදිරිපත් කර නොතිබුණු අතර 2018 ජනවාරි සිට මාර්තු දක්වාවූ වියදම් වල එකතු වටිනාකම රු. 10,552,014 ක් කළමණාකරන කමිටුව විසින් අනුමත කර නොතිබුණි. | කළමනාකරණ කමිටු වාර්තා පොත විගණනයට ඉදිරිපත් කළයුතු අතර අදාල අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළ යුතු වේ. | පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඈ) | 2017 අප්‍රේල් 19 දින හා අංක 03/2017 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව නිලධාරින්ගේ පැමිණීම හා පිටවීම සනාථ කිරීම සඳහා ඇඟිලි සලකුණ කිරීමේ යන්ත්‍ර භාවිතා කළයුතු වුවද, 2018 අගෝස්තු 01 වන දින සිට 2019 මැයි 15 දින දක්වාවූ කාල පරිච්ඡේදයේ ඇඟිලි සලකුණ යන්ත්රය භාවිතා කර නොතිබුණි. | අදාල චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතු වේ. | ඇඟිලි සලකුණු යන්ත්‍රය නැවත සවිකිරීමට කටයුතු කරනු ලැබේ. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමත කර ඇති සේවක සංඛ්‍යා ලැයිස්තුව අනුව සභාවේ තනතුරු 09 ක් පුරවා නොතිබුණි. | පුරප්පාඩු අවශ්‍යතාවය අනුව පුරවා ගැනීමට කටයුතු කළ යුතු වේ. | පුරප්පාඩු වලට අවශ්‍ය කාර්ය මණ්ඩල එවන ලෙස පළාත් රාජ්‍ය සේවා කොමිසම් සභාවෙන් ඉල්ලා ඇත. |
| (ආ) | 2015 සැප්තැම්බර් 01 දින අම්පාර ප්‍රාදේශීය පළාත් පාලන කාර්යාලට සභාවේ සිට තාවකාලික නිදහස් කරන ලද සනිපාරක්ෂක කම්කරු මෙතෙක් ආපසු එවා නොතිබීමෙන් වැසිකිළි පිරිසිදු කිරීම සහ සෞඛ්‍ය කටයුතු සඳහා කාර්ය මණ්ඩල හිඟයක් පැවතුණි. | තාවකාලිකව නිදහන් කරන ලද සනීපාරක්ෂක කම්කරු නැවත ලබා ගැනීමට කටයුතු කළ යුතු වේ. | පිළිතුරු එවා නැත. |
| (ඇ) | ස්ථාන මාරුවී ගිය සහ සේවයෙන් හැර ගිය සේවකයින් 24 දෙෙනෙකුගෙන් අයවිය යුතු රු. 104,918 ක් වසර 11 කට වැඩි කාලයක සිට අයකර ගැනීමකින් තොරව දිගටම මූල්‍ය ප්‍රකාශනවල දක්වමින් තිබුණි. | රාජ්‍ය සේවක හිඟ ණය ශේෂය අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | හිඟ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ. |

**3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභා බල ප්‍රදේශයේ පදිංචිකරුවන් 14,563 ක් පදිංචිව සිටියද, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 138(2) වගන්තිය අනුව 2018 වර්ෂය සඳහා වරිපනම් බදු අයකිරීමට (“K“ආකෘති පත්‍ර) ප්‍රාදේශීය සභා විසින් නිවාස 487 ක් සඳහා පමණක් ලබාදී තිබුණි. තවද, “K“ආකෘති පත්‍ර පසුගිය වර්ෂ 05 තුල පදිංචිකරුවන් සියයට 05 ක පමණකට බෙදාහැර තිබුණි. | සභා බලප්‍රදේශයේ පදිංචිකරුවන්ට “K“ආකෘති ලබා දී සම්පූර්ණ වරිපනම් බදු අයකර ගත යුතු වේ. | ණය අයකිරීම් සඳහා බෙරුම්කරුවන් පත්කිරීමට කටයුතු කරද, සේවක හිඟය නිසා ප්‍රමාද සිදුවීය. සියළුම අයට “K“ආකෘත්තිපත්‍ර ලබා දීමට කටයුතු කරමි. |

**3.5 වත්කම් කළමනාකරණය**

**වත්කම් ලේඛන ගත නොකිරීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය අවසාන දක්වා සභාව සතු ඉඩම් සහ ගොඩනැගිලිවල එකතු වටිනාකම රු. 184,416,846 ක් ලෙස ගිණුම්වල පෙන්වා තිබුණද, සංචල හා නිශ්චල වත්කම් ලෙස ස්ථාවර වත්කම් ලේඛනයේ සටහන් කිරීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි. | සංචල හා නිශ්චල වත්කම් ස්ථාවර වත්කම් ලේඛනයේ සටහන් කිරීමට කටයුතු කල යුතු වේ. | ස්ථාවර වත්කම් ලේඛනයක් භාවිතයේ තිබුණද, එහි දිගටම සටහන් කිරීම් සිදුවී නොතිබුනි. ඉදිරියේ ප්‍රවර්ධනය කිරීමට කටයුතු කරමි. |

**3.6 ප්‍රසම්පාදනය**

**3.6.1 ප්‍රසම්පාදන සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ප්‍රසම්පාදන සැලැස්මක් සකස්කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේ සභාව විසින් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කළ යුතු වේ. | ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කිරීමේ අපහසුතාවයන් කීපයක් ඇත. සභාව විසින් නිතරම හදිසි මිලදී ගැනීම් කිරීමට සිදුවේ. ඉදිරියේදි සකස්කිරීමට කටයුතු කරමි. |

### 3.6.2 කොන්ත්‍රාත් පරිපාලනය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ප්‍රසම්පාදන අත්පොතේ 3.9.1 වගන්තිය අනුව ප්‍රජා පාදන සමිතිවලට පෙර ලබා දී තිබූ කොන්ත්‍රාත් වලින් සම්පූර්ණ කර නැත වටිනාකම් සහ දැනට දීමට බලාපොරොත්තුවන කොන්ත්‍රාත් වටිනාකම සමඟ රුපියල් මිලියන 02 ක් ඉක්ම නොවිය යුතු බව සඳහන් කර තිබුණද, එයට පටහැනිව රුපියල් මිලියන 04 කට බාරදී තිබුණි. | ප්‍රසම්පාදන අත්පොත කොන්දේසි අනුව කොන්ත්‍රාත් වැඩ භාරදීම කටයුතු කළ යුතු වේ. | හදිසියෙන්අවසන් කිරීම සඳහා මෙසේ කිරීමට සිදුවි ඇත. ඉදිරියේදී මේ අනුව කටයුතු කරමි. |
| (ආ) | අට්ටප්පල්ලම මුස්ලිම් සුසාන භූමියට පස් පිරවීමේ කටයුතු රු. 798,395 ක් වටිනාකමට 2018 දෙසැම්බර් 12 දින වැඩ නිමකර තිබුණද, 2019 මැයි 22 දිනය දක්වා බොරලු පස් නිසි පරිදි සකස් කිරීමකින් සහ තුනී කිරීමකින් තොරව දමා තිබුණි. | බොරලු පස් නිසි පරිදි සකස් කිරීමට කටයුතු කළ යුතු වේ. | සුසාන භූමිය බොරලු පස් නිසි පරිදි තුනී කිරීමට කටයුතු කරනු ලැබේ. |
| (ඇ) | නින්තවූර් 06 වන ප්‍රදේශයේ විනෝදාංශ ස්ථානයේ ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා රු. 1,193,805 ක මුදලක් වැය කර 2018 දෙසැම්බර් 20 දින වැඩ නිමකර තිබුණද, දමන ලද පස් ගිලාබැස අත්තිවාරමේ පිපිරීම් ඇති වී තිබුණි. | පඩිපෙළ දෙපැත්ත ඉරිතලා තිබුණත්, අවශ්‍ය කටයුතු කර නොතිබුණි. | පිළිතුරු එවා නැත. |

## 4 ශිණුම් කටයුතු භාවය සහ යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණන

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී සභාවේ අභ්‍යන්තර විගණනයන් සිදුවී නොතිබුණි. | සභාවේ අභ්‍යන්තර විගණන කටයුතු සිදු කළ යුතු වේ. | පිළිතුරු එවා නැත. |

**4.2 විගණන හා කළමනාකරණ කමිටු**

-------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි. | විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා රැස්වීම් පැවැත්වීමට කටයුතු කළ යුතු වේ. | පිළිතුරු එවා නැත. |

**4.3 විසඳි නොතිබූ විගණන නිරීක්ෂණය**

---------------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2012 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා සභාවේ JCB රථය බාහිර වැඩ සඳහා පුද්ගලයන්ට කුලියට දීම වෙනුවෙන් ලැබිය යුතු රු. 530,820 ක හිඟ කුලි අයකර ගැනීමට හෝ අදාල අයට එරෙහි නිත්‍යානුකූලව කටයුතු කිරීමට කටයුතු කර නොතිබුණි. | අයවියයුතු කුලී අයකිරීමට හෝ අදාල අයට එරෙහිව නීත්‍යානුකූලව කටයුතු කළ යුතු වේ. | පිළිතුරු එවා නැත. |
| (ආ) | 2016 වර්ෂයේ ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන යටතේ සභාව විසින් ළමා උද්‍යානය සහ රථ ගාල යට තණකොළ පිඩැලි ඇල්ලීමේ කොන්ත්‍රාතුව වැඩ නිමකර ඇති බව තාක්ෂණ සේවා නිලධාරි විසින් සහතික කර තිබුණද, අදාල කාර්මාන්ත ආරම්භ කර නොතිබුණු අතර කම්කරු කුලි වශයෙන් රු. 18,900 ක් ගෙවා තිබුණි. | වැඩ ආරම්භ නොකර තිබුණද, ගෙවීම් කිරීම සම්බන්ධයට අදාල පුද්ගලයන්ගෙන් ගෙවූ මුදල අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | පිළිතුරු එවා නැත. |